# උපාදානස්කන්ධ
# 14.05 2016 - ශ්‍රී ලංකාරාමය
# නවසීලන්තය

සැම දෙනාටම තෙරුවන් සරණයි!

මේ වෙලාවේ අපිට තියෙන්නේ ධර්ම සාකච්ඡාවක් කරන්න. ගොඩක් මාතෘකා තියෙනවා කථා කරන්න. මේ පිරිස අහන බණ දේශනාවන් තුල, පිරිසක් අතර ඇති වෙච්ච සාකච්ඡාවන් තුල, හිතාගෙන යනකොට, මෙනෙහි කරගෙන යනකොට, දැන ගත්තොත් හොඳයි කියල ඇතිවෙච්ච ප්‍රශ්න තියෙනවා නම් ඒවා මතක් කරන එකත් හොඳයි. එතකොට ඒ ටිකත් පැහැදිලි කරලා දෙන්න පුළුවන් කම තියෙනවා. ඒකත් සමහර වෙලාවට වටිනා පාඩමක් වෙයි.

ඉස්සරවෙලාම උපාදානස්කන්ධ ගත්තට පස්සේ රහතන්වහන්සේලාගේ හිතේ - රහත් වෙන අවස්ථාව දක්වාම තියෙනවා 'චේතනාව' කියන ධර්මය. රහත් උනාට පස්සෙත් තියෙනවා. අපිට තිබෙන චේතනාව රැස් කරන චේතනාව. ඒකට අපි technical වචනයක් දෙනවා පාලියෙන් අභිසංස්කර ගතිය කියල. අභිසංස්කරණය කරනවා කියන්නේ යම්කිසි බලයක්නේ. ඒ බලය, ඒ ශක්තිය එක්රැස් වෙන්න නම් යම්කිසි අරමුණකට ඇලීමක් තියෙන්න ඕන. දකින - හිතෙන - බලන - අහන ආදී මොකක් හරි එහෙකට ඇලීමක් තියෙන්න ඕනේ. ඒකට කියනවා තණ්හාව කියල. නිකාන්තිය කියලත් කියනවා.

චේතනාව = රැස්කරන ගතිය = අභිසංස්කර ගතිය

තණ්හාව = නිකාන්තිය

අපි හැම එක්කෙනාගේම හිතේ චේතනාව තියෙනවා. ඒ චේතනාවට තියෙන්නේ හැම වෙලේම ගිය ගිය තැන, ඇලිච්ච ඇලිච්ච තැන, වැටිච්ච වැටිච්ච තැන මොකක් හරි හූරගෙන එන ගතිය. මොකක් හරි එක්කාසු කර ගන්නවා. ලොකු වශයෙන් පොඩි වශයෙන් මොනවා හරි දෙයක් බෑග් එකට එක්කාසු කර ගන්න ගතිය තමයි චේතනාවේ තියෙන්නේ. එහෙම කරන්න පුළුවන්කම තියෙන්නේ හැම වෙලාවෙම නිකාන්ති ලක්ෂණය තිබෙන තණ්හාව තියෙන නිසා. ඒ කියන්නේ යම්කිසි තැනකට ගිහිල්ල එකතුකරන්න නම් යමක වදින්න එපායැ.

නේද? හැප්පෙන්න එපායැ. හැප්පුනට පස්සේ හූරලා ගන්න තියෙන්න ඕනැ. ඒකනිසා ඇලෙන ගතිය - නිකාන්ති ගතිය තියෙනවා. එතකොට ඒ චේතනාවට හැමවෙලේම තියන්නේ රැස් කිරීමේ ගතිය, ඒ වැඩේ කරන්න පුළුවන්කම තියෙන්නේ තණ්හාව තියෙන නිසයි. තවත් එකක් තියෙන්න ඕනේ, ඒ තමයි මුලාව - (අවිජ්ජා). යම්කිසි අරමුණකට ගියාද ඒ අරමුණේ නොදන්නා ගතිය තියෙන්න ඕනේ. යම්කිසි අරමුණක නොදන්නා ගතිය හින්ද තමයි එතන තියෙන නරක දෙයක් එක්කාසු කරගෙන එන්නේ. දැන් තේරුනාද? දැන් යම්කිසි දේකට අලුනොත් එහෙම, එයින් යමක් එකතු කරොත් එහෙම, ඒ එකතු කරන්නේ නිකං නෙමෙයි - අනාගතයටත් එක්කයි. චේතනාවෙන් එකතුකර ගත්ත එක එතනින් නතර කර ගන්නේ නැ. ඊට පස්සේ ලිහල බලන්න අනාගතේටත් එක්කයි රැස් කරන්නේ. ඒකට **'භව'** ගතිය කියල තව උපාදාන කරන ගතියත් තියෙනවා. දැන් බලන්න මේ ටික ඔක්කොම එකට සාමූහිකව තමයි ඇතිවෙන්නේ.

චේතනාව = රැස් කරන ගතිය = අභි සංස්කර ගතිය

තණ්හා = නිකාන්තිය

අවිජ්ජා = මුලාව

භව

උපාදාන


මේ ටික ඇති වෙන කොට රැස්වීම කියන එක හොඳටම තියෙනවා අපේ හිතේ. යම්කිසි කෙනක් රහත් වෙනවා කියල කියන්නේ නිර්වාණ ධාතුව හිතින් සපර්ෂ වෙනවා කියන එකයි. ඒ නිර්වාණ ධාතුව හිතින් සපර්ෂ වෙනකොට චේතනාවේ තිබෙන ඒ රැස් කරන ගතිය එතනින් අයින් වෙනවා. ඒ රැස් කරන ගතිය නැති උනායින් පස්සේ එතන තියෙන්නේ මොකක්ද? උපාදානය කරන්නේ නැති, තණ්හාව ස්පර්ශ කරන්නේ නැති, එයට අවිද්‍යාව කරපු නැති ගතියක් තමයි තියෙන්නේ. රැස් කරනකොට තණ්හාවත් එන්න ඕනේ අවිද්‍යාවත් තියෙන්න ඕනේ උපාදානයත් තියෙන්න ඕනේ. මේ ටිකේ support එකත් එක්ක තමයි මේ ටික සිද්ධ වෙන්නේ. රහතන්වහන්සේගේ හිත නික්ලේශී වෙලා යනකොට අවිද්‍යාවත් ඒ එක්කම නැති වෙනවා. තණ්හාවත් ඒ එක්කම නැතිවෙනවා. භව

හදන ගතියත් නැති වෙනවා. උපාදාන කරන ගතියත් නැති වෙනවා. එහෙම අවස්ථාවකදී නිර්වාණ ධාතුවට උපාදාන කරන්නේ නෑ, අනුපාදානයි. එහෙම උනාට පස්සේ රහතන්වහන්සේට ඒ වෙලාවේ තියෙන්නේ මොකක්ද? එතනින් එහාට පහළ වෙන ඔක්කෝම හිත්වල තිබෙන 'චේතනාව' කර්ම රැස් කරන්නේ නැති චේතනාවල් බවට පත්වෙනවා. කර්ම රැස් කරන්නේ නැති හිතක් බවට පත්වෙනවා. හැබැයි රහතන්වහන්සේගේ ආර්ය හිත එහෙම උනාට රහතන්වහන්සේට තිබෙනවා ඉස්සර වෙලා තිබ්බ්ච අවිද්‍යාව, තණ්හාව, උපාදානය සහ භවය නිසා හදපු ශරීරයක්. ඒක පරිහරණය කරනවා. ඒ ශරීරය පරිහරණය කිරීමේදී - අපි හිතමු සාමාන්‍ය කෙනෙක් ජීවිතිය පරිහරණය කරනකොට ඒ කෙනා ඒ ජීවිතියට තදබල බැඳීමක් තියෙනවා. ජීවිතය නැති වෙයිද කියල බයක් තියෙනවා? හැම වෙලේම බේත් හේත් ගන්න - රකින්න ඕනෑකම තියෙනවනේ. ගොඩක් තමන්ගේ ශරීරයට උපාදානය වෙලා තියෙන්නේ. ඒ උපාදානය නිසා හරියට බයයි ඒක නැති වෙයි කියල. ඇස් නොපෙනෙයි, කන් නොඇසෙයි කියල ගොඩක් බයක්, ඒක රකින්න ඕනේ කියන ගතිය තියෙනවා. රහතන්වහන්සේට එහෙම ගතියක් නෑ. එහෙම ගතියක් නැත්තේ රහතන්වහන්සේ දැන ගත්ත මේ ශරීරය රකින්න බෑ කියල. මුලාව නැති උනා. රකින්න බැරි නිසා තණ්හා කරලා වැඩක් නෑ කියල දැනගත්ත. ඒක නිසාම කර්මය හැදෙන්නත් නෑ. සාමාන්‍ය කෙනෙක් ජීවිතය පරිහරණය කිරීමේදී සිතේ තණ්හාව ඇතිවෙනවා. චේතනාව ඇතිවෙනවා. කර්ම රැස් වෙනවා, අවිද්‍යාව තද බල විදියට තිබෙනවා. රහතන්වහන්සේගේ අවිද්‍යාව නෑ. සාමාන්‍ය කෙනෙකුට වේදනාවක් දැනෙන කොට ගැටීමක් ඇති වෙනවා. වේදනාවක් දැනෙනකොට හරි තරහක් එනවා. ගැටීමක් එනවා. කෑ ගහනවා. වේදනා විඳිනව. රහතන්වහන්සේටත් වේදනාව තියෙනවා. රහතන්වහන්සේත් වේදනාව දකිනවා, වේදනාව දැන ගන්නවා, හැබැයි ක්‍රියා මාත්‍ර සිතක් පමණයි පහළ වෙන්නේ. අකුසල් සිත් 12 න් එකක්වත් රහතන්වහන්සේට පහළ වෙන්නේ නෑ. පෘත්කජන කෙනාට කායික වේදනාවක් හෝ මානසික වේදනාවක් දැනීමේදී විදර්ශනා හිතක් තිබුනොත් පමණක්, ඒ තිබෙන මාත්‍රයට ඔහුට කුසල් සිත් පහළ වෙනවා. කුසලයක් සිද්ධ වෙනවා. අනිත් සෑම වෙලාවකම එක්කෝ ලෝභ කරනවා එහෙම නැත්නම් වැඩිපුර පටිසය ඇතිවෙනවා. රහතන්වහන්සේට නිරතුරුවම පහළ වෙන්නේ ඥාන සම්ප්‍රයුක්ත හෝ ඥාන විප්‍රයුක්ත, සෝමනස්ස සහගත හෝ උපේක්ඛා සහගත සසංඛාරික හෝ අසංඛාරික සිතුවිලි. එතකොට රහතන්වහන්සේලාට කායික වේදනාවක් ඇති උනහම උන්වහන්සේලා උපාදානය කරන්නේ නෑ ඒ ධර්මය ඒ විදියට දකිනවා. වේදනාව ඒ විදියට

දකිනවා, දැනගන්නවා උපාදාන කරන්නේ නෑ. ඒ උපාදානය වෙන්නේ නැත්තේ ඇයි? උපාදානය කරන්න තිබු ගතිය නිර්වාණ ධාතුව සපර්ෂ කිරීමේදී නැති වී ගිය බැවින්. ඒකනිසා රහතන්වහන්සේට ඒ වෙලාවට ඇතිවෙන්නේ උපාදානස්කන්ධයක් නෙමෙයි සංස්කාර ස්වභාවයක් විතරයි.

අපිට සිතුවිල්ලක් ඇතිවෙන කොටම ඒ සිතුවිල්ලත් එක්කම සකන්ධ 5 ක් හැදෙනවා, නේද? තේරුනාද? පංචඋපාදානස්කන්ධ හැදෙන්නේ කොහොමද? දකින අරමුණක් තිබෙනවා - හිතන අරමුණක් තිබෙනවා. දකින අරමුණ අපි හිතමු මලක් කියලා. ඊට පස්සේ ඇසක් තිබෙනවා. මෙතන තිබෙනවා රූප දෙකක්.

චක්ඛු ප්‍රසාද රූපය





ආරම්මණ රූපය

චක්ඛු ප්‍රසාදයට ආරම්මණ රූපය අරමුණු වෙනකොටම වේදනා ගතියක් ඇතිවෙනවා. ඊට පස්සේ අනෙකුත් බාහිර රූප සියල්ලගෙන්ම මල පමණක් වෙනකොට ගැනීමක් වෙනවා. ඒකට කියනවා සංඥාව කියල. ඊලඟට තියෙනවා ඒ මල ගැන හිතවන ගතිය. ඒකට කියනවා චේතනාව කියල (මෙතන චේතනා චෛතසිකය ප්‍රධානව තවත් චෛතසික සමුහයක් තියෙනව). ඒ ඔක්කොම එකතුව සංඛාර කියල කියනවා. අනිත් එක තමයි හිත - විඤ්ඤාණය. මේ සියල්ල ඇති වෙන්නේ එක හිතක.

රූප = ප්‍රසාද රූපය + ආරම්මණ රූපය

වේදනා

සංඥා

සංස්කාර = චේතනාව ප්‍රධාන චෛතසික සමූහය

විඤ්ඤාණය

මේ වේදනා සංඥා සංස්කාර විඤ්ඤාණය යන පහ ක්‍රියාත්මක වෙනවා බාහිර ආරම්මණයට අනුව. හැදෙන හැදෙන හැම සිතක් ගානෙම මේ වගේ 5 හේ ගොඩවල් පැන පැන - පැන පැන යනවා. හැමවෙලාවෙම සිතුවිල්ලක් එනකොට 5 ක් හැදෙනවා. අරමුණක් එනකොට 5 ක් හැදෙනවා. ජවන් සිත් වලත් පංච ස්කන්ධ - පංච ස්කන්ධ තමයි යන්නේ. මෙහෙම හිතන්න. දැන් චිතක්ෂණ 17 ක් තියෙනවනේ. ස්කන්ධ වශයෙන් ගත්තට පස්සේ හැම චිත්තක්ෂණයකම ස්කන්ධ 5 බැගින් තියෙනවා. හැබැයි ස්කන්ධ නමින් නෙමෙයි අපි ඒවා පාවිච්චි කරලා තියෙන්නේ. ඒවා වෙන වෙන නම් වලින් තමයි තියෙන්නේ. වෙන වෙන නම් වලින් තිබුනට ධර්ම වශයෙන් ගත්තට පස්සේ ස්කන්ධ ධර්ම තමයි තියෙන්නේ. මේක වැටහුනාද? ඔය ස්කන්ධ 5 හැදෙන තාලේ කිව්වේ. එක චිත්තක්ෂණයක හැදෙනවා ස්කන්ධ 5 ක් හැබැයි අපි සාමාන්‍ය ලෝකේ මිනුස්සුන්ට තේරෙන හැටියට සම්මුති භාෂාව ස්පර්ශ කරමින් තමයි ගොඩක් කියල දෙන්නේ. ගැඹුරට යනකොට ඒවා හොඳට තේරෙනවා ප්‍රඥාව නිසා.

රහතන්වහන්සේට තියෙන්නේ උපාදානය කරන ස්කන්ධ නෙමෙයි. උපාදානයක් කෙරෙන්නේ නැති ස්කන්ධ පංචකයක් වැඩ කරනවා. රහතන්වහන්සේට චේතනාව තියෙනවා. රහතන්වහන්සේට සංඥාව තියෙනවා. රහතන්වහන්සේට අනිත් චෛතසික ධර්ම තියෙනව. රහතන්වහන්සේට 'අවිද්‍යාව නෑ' 'තණ්හාව නෑ' 'උපාදානය කරන්නේ නෑ' 'භව හදන්නේ නෑ'. 'චේතනාව' ප්‍රධානව අනිත් ඒවා තියෙනවා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස එතකොට රහතන්වහන්සේගේ සිතෙහි පහළ වෙන චිත්ත වීථියක ඔය සංඥාව වේදනාව ආදී සියල්ලම තියෙනවද?

<u>පිළිතුර</u> - මහත්මයා, ඇත්ත වශයෙන්ම වේදනාව තිබුන නිසාම ඒක නරක් වෙන්නේ නෑ. වේදනාව නරක් වෙන්න හේතුවක් තියෙනවා. වේදනාව නරක් වෙන්නේ, ඒ කිට්ටුවෙන් තණ්හාව, අවිද්‍යාව එහෙම ගැවිලා තිබුනොත් තමයි. එතකොට තමයි නරක ආශ්‍රය නිසා නරක් වෙන්නේ. නැත්නම් වේදනාව ඔය තියෙන එකක් විඳගෙන සද්ද නැතුව කට පියාගෙන ඉන්නවා.

දැන් සංඥාව තියෙනවනේ. ඒකෙන් යම් කිසි දෙයක් හඳුනා ගන්නවා. සංඥාවේ තියෙන්නේ හඳුනා ගැනීමේ ගුණය. එතන නරක් වෙන්නේ, සංඥාව විසින් හඳුනා

ගත්තයින් පස්සේ 'තණ්හාව' 'අවිද්‍යාව' එහෙම ගිහිල්ල කරන වැඩේ තමයි උදාහරණයක් ලෙස අපි මෙහෙම හිතමු, මලක් ගත්තයින් පස්සේ ඒකෙ තියෙන වර්ණය විතරයි 'සංඥාව' කියන එක ගන්නේ. 'සංඥාව' ඒ මලේ වර්ණය ගත්ත ගමන් 'අවිද්‍යාව' කරන්නේ 'ඕක හොඳයි මගුල් ගෙදරකට' කියලා අදහසක් ඉදිරිපත් කරනවා. ඒක කරපු ගමන්ම වර්ණය තේරුම් ගැනීමෙන් අයින්වෙලා එයා වෙන වෙන ජාති දා ගන්නවා. ඒ 'සංඥාව' නරක් වෙනවා. ඒක 'අකුසල සංඥාවක්' වෙනවා. ඒ 'අවිද්‍යාව' තිබුනොත්. ඊට පස්සේ 'තණ්හාව' ගිහිල්ල තවත් ඒක උලුප්පවල දානවා. ඊට පස්සේ අනාගතයටත් මේ වගේ තව එකක් ගන්න වැඩ සටහනක් හදා ගන්නවා, ඒකෙ ඇලෙනවා. ඔන්න ඔය වගේ වැඩක් තමයි ඕකේ තියෙන්නේ. 'වේදනාව' රහතන්වහන්සේලාට තියෙනවා. 'තණ්හාවයි' 'අවිද්‍යාවයි' නැති නිසා ඒ 'වේදනාව' ඒ 'සංඥාව' ඒ වෙලාවට ක්‍රියා සිතකින් විඳල ඉවරකරලා දානවා. සමහර වෙලාවට රහතන්වහන්සේලාට විපාක සිත් ඇති වෙනවනේ. ඒ විපාක සිත් අහේතුකයි. අපිට වගේමයි.

## <u>සිත් ගලපා ගැනීම</u>

## <u>14.05 2016</u>

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස දැන් ඔය චිත්ත වීථි නම් කරලා තියෙනවනේ භවාංග, භවාංග චලන කියල. එතකොට ඒවා සිත් 89 ට ගලප ගන්නේ කොහොමද?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒක හැබෑ ප්‍රශ්නයක් තමයි හොඳයි. අපි මෙහෙම තේරුම් ගනිමු. 'කුසල' 'විපාක' 'ක්‍රියා' කියල තියෙනවනේ සිත් 24 ක්. අපි ඒ ටිකෙන් ගමු. දැන් කුසල් සිත් 8 ක් තියෙනවා. ඒ කුසල් සිත් අටෙන් අපි උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම

**'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත'** - දැන් මේක සිත් 89 යට අන්තර්ගතයිද? ඔව්. එතකොට මේ සිත කුසල් සිතක්. මේ සිත අද දවසේ අපි නිෂ්පාදනය කරනවා. දැන් මේ කුසල් සිත අරමුණකට දාපු ගමන්ම මේ සිතේ activate වෙනවා ශක්තියක්. ඒකට කියනවා කුසල ශක්තිය කියල. ඒ කුසල ශක්තිය ඒ කුසල් හිතේ තියෙනවා. දැන් මේ සිත, කුසලය එකතු කරපු තැනක්. දැන් මේ එකතු කරපු කුසල ශක්තිය යම්කිසි වෙලාවක ස්වභාවයෙන්ම මතු වී එනවා. මෙහෙම මතු වෙලා ඒක විපාකයක් බවට පත්වෙනවා. එතකොට ඒ සිත

**'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික විපාක සිත'** නමින් හඳුන්වනවා. මේ විපාක සිත ඉබේ මතු උනේ, ඉස්සෙල්ල **'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිතක්'** හැදිච්ච හින්දයි. හොඳයි, දැන් මේ සිත, සිත් 89 list එකේ තියෙනවද? ඔව් තියෙනවා

දැන් අපි මිය යනවා. ඒ මිය යන අවස්ථාවේදී අපිට කර්මය, කර්ම නිමිත්ත හෝ ගති නිමිත්ත ඇති වෙලා ඒවා සපර්ශකරන හිතක් පහළ වෙනවා. අපි හිතමු මේ විදියට මරණාසන්න චිත්ත වීථියක් පහළ වෙනවා කියල. භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - මනොද්වාරාවජ්ජන - ජවන - ජවන - ජවන - ජවන - ජවන - ඊට පස්සේ චුතිය ඇතිවෙලා ප්‍රතිසන්ධිය ගන්න අවස්ථාවේදී අර පෙර රැස් කරගත්තු කුසල ශක්තියේ විපාකයක් වශයෙන් පහළ වූ 'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික විපාක සිත' ගිහිල්ල සම්බන්ධ වෙනවා.

(සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික විපාක සිත)

(භ) – (භ.ච) – (භ. උප) – (ම) – (ජ) – (ජ) – (ජ) – (ජ)- (ජ) –(චු) | (ප්‍රතිසන්ධි)

දැන් මේ 'සිත' ප්‍රතිසන්ධි අවස්ථාවේදී කථා කරන්නේ **'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික විපාක සිත'** කියන ප්‍රධාන නමින් නෙමේ. ඒ වෙලාවේ සිද්ධ කරන්නාවූ ක්‍රියාව නමින් තමයි නම් කරන්නේ. ප්‍රතිසන්ධියක් වශයෙන් ජීවිතියක් ආරම්භ කර නිසා ඒ ඒ අවස්ථාවේදී හඳුන්වන්නේ 'ප්‍රතිසන්ධි සිත නමින්'. ඒකෙන් අපි තේරුම් ගන්න ඕනේ ඒ සෝමනස්ස සහගත සිතේ තිබෙනවා ප්‍රතිසන්ධිය හදන ශක්තිය කියල. දැන් මුළු ජීවිත කාලයේම භවාංගය ලෙස ඇතිවෙන්නේ මොකක්ද? ඒ ප්‍රතිසන්ධි සිත වූ සෝමනස්ස සහගත සිතමයි.

<u>ප්‍රශ්නයක්</u> - විපාක සිතකින් තවත් විපාකයක් හදනවද?

<u>පිළිතුර</u> - විපාක සිතකින් තවත් විපාක සිතක් හැදෙන්නේ නෑ. කර්ම සිතකින් විපාක සිතක් හැදෙනවා. මෙහෙමයි වෙන්නේ. කර්මය, කර්ම නිමිත්ත, ගති

නිමිත්ත කියල එනවනේ. ඒ කර්මය, කර්ම නිමිත්ත, ගති නිමිත්ත කියල එන ඒවා නිකං එන්නේ නෑ. ඒවා උලුප්පලා දෙන්න පුළුවන් කර්ම පෙර හදල තියෙන්න ඕනේ. ඒවගේ බලයෙන් තමයි මෙයාට ඒවා පෙන්නන්නේ. එතකොට ඒ මරණාසන්නයේ ඉන්න කෙනාගේ හිතට පහළ වෙන කර්මය, කර්ම නිමිත්ත, ගති නිමිත්ත අතුරින් ඕනෑම නිමිත්තක් පහළ වෙන්නේ පෙර හදපු කර්මයක විපාකයක් හැටියට. එයින් එක නිමිත්තක එල්ලිලා තමයි අනිත් ස්ථානයට පනින්නේ.

අපිට පටලැවෙන තැන් තියනවා. 'ප්‍රතිසන්ධි සිතයි' 'චුති සිතයි' 'භවාංග සිතයි' ඔක්කොම එකයි. නම් වශයෙන් වෙනස්. අවස්ථාවට අනුකූලව නම තැබුවා මිසක ඒවා අර සිත් 89 list එකේ එන පරණ හිත්මයි. දැන් එක්කෙනෙක් ඇහුව බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පෑවේ මොන හිතින්ද? කියලා. දැන් බෝධිසත්වයෝ ඉපදුනානේ හිතකින්, ඒක දක්වල තිබෙනවා. බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පාන්න කලින් චතුත්ථ ධ්‍යානයට සම වැදුනනේ. එතකොට තිබෙනවානේ රූපාවචර සිත් අරූපාවචර සිත්. බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පාන්න කලින් නිරෝධ සමාපත්තියටත් සම වැදුනනේ. එතකොට සිත් මුකුත්ම නැනේ. ඊට පස්සේ හිත ආයිමත් activate වෙනවනේ. ඊට පස්සේ ඵල සිතවලින් ආයිමත් පහළට පහළට බැහැගෙන බැහැගෙන අරූපාවචර රූපාවචර වශයෙන් එනවනේ. දැන් චතුත්ථ ධ්‍යානයට සම වැදුනහම ඒ 'ධ්‍යාන හිත' තියෙනවනේ. අවසානයට බුදුරජාණන්වහන්සේ චතුත්ථ ධ්‍යානයේ ඉඳල පහළට ආවනේ - ප්‍රථම ධ්‍යානයට. නැවතත් ප්‍රථම ධ්‍යානයෙන් දෙවෙනි, තුන් වෙනි හතරවෙනි ධ්‍යානවලට සම වැදිලා ඊට පස්සෙනේ පිරිනිවන්පෑව කියල කියන්නේ. එතකොට අපිට හිතෙනවා නේද බුදුරජාණන්වහන්සේ පිරිනිවන්පාල තියෙන්නේ ධ්‍යාන සිතකින් කියල නේද? බැලුවයින් පස්සේ එහෙමනේ පෙන්නේ. හැබැයි, බුදුරජාණන්වහන්සේගේ හිත ප්‍රධාන අරමුණකට අනුව ක්‍රියා කරපු හැටි තමයි ඒ. බුදුරජාණන්වහන්සේ පිරිනිවන්පෑවේ චතුත්ථ ධ්‍යාන හිතෙන් නෙමෙයි. චතුත්ථ ධ්‍යාන හිත කියල කියන්නේ පිරිවන්පාන හිතක් නෙමෙයි. චතුත්ථ ධ්‍යාන හිතකින් පිරිනිවන්පාන්න පුළුවන්කම තියෙන්නේ බ්‍රහ්මයන්ට විතරයි. දැන් බෝධිසත්වයන් වහන්සේ ඉපදුනේ මොන හිතින්ද? **'මෛත්‍රී පූර්වාගම සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික හිතකින්'** කියනවනේ බෝධිසත්වයන් වහන්සේ පිළිසිඳගත්තේ මහා මායා

දේවියගේ කුසේ. හේතුව බෝධිසත්වයන් වහන්සේ උප්පත්තිය ලැබුවේ සත්වයක් කෙරෙහි කරුණාවෙන්නේ, 'මම මේ අයට පිහිට වෙන්න ඕනේ, මේ අයගේ දුකට පිහිට වෙන්න ඕනේ, උදව් කරන්න ඕනේ' කියල කරුණාබර හිතකින්නේ පහළ උනේ. එතකොට ඒ මෛත්‍රී සහගත චේතනාව පූර්වාංගම උනානේ. මෛත්‍රී සහගත සිතෙන් ඇවිල්ල මව්කුසේ ඉපදුනා **'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත'**. ඉතිං ඒ සිත බොහෝ ප්‍රබල හිතක්නේ. ඉතින් මුළු ජීවිත කාලයම බෝධිසත්වයන් වහන්සේ මොන වෙලාවක සැතපුනත් මොකක්ද ක්‍රියාත්මක වෙන හිත?. අපි හිතමු පැයක් සැතපෙනවා කියල. **'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික විපාක'** සිතේනේ ඉන්නේ. ඉතින් සැප සහගත නැත්ද? පොඩි වෙලාවක් සැතපුනාට පස්සේ කොච්චර සහනයක්ද, නේද?

ඒවගේ තමයි අපිටත්, මෙතනින් චුතවෙලා ගිහිල්ල තව කොහේ හරි ඉපදුනාට පස්සේ පොඩි වෙලාවක්, විනාඩි 15 ක් 20 ක් හරි නිදා ගන්න උනොත් හොඳ හිතකින් නිදා ගන්න ඕනේ නම් දැන්ම ඉදන්ම හොඳ කුසල් හිත් හදන්න ඕනේ. එතකොට තමයි එහෙදි ඒ හිත පහළ වෙන්නේ. අපි ඒ ගැනත් හිතන්න ඕනේ. දැන් බුදුරජාණන්වහන්සේ පැයයිලු දවසකට සැතපෙන්නේ. ඒ පැය අතර හරි හොඳ විවේකයක් ගන්නවා. දැන් බුදුරජාණන්වහන්සේගේ චුතිය සිද්ධ වෙන්නේ මොකෙන්ද? අවසාන හිතත් **'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිතමයි'.** ඒ කියන්නේ 'ප්‍රතිසන්ධියයි' 'භවාංගයයි' 'චුතියයි' එකයි. හැබැයි **'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික හිත'** අලුත් ජීවිතියකට හොඳ ශක්තියක් හැටියට ඉදිරිපත් වෙච්ච නිසා එතනදී ඒ කරපු වැඩේ හින්ද අපි කියනවා **'ප්‍රතිසන්ධි සිත'** කියල.

දැන් අපි හිතමු මෙහෙම, ගුණවර්ධන කියල මහත්තයෙක් ඉන්නවා. සල්ලි මිල මුදල් තියෙන කෙනෙක්. ඉතින් එයා කල්පනා කරා ඔය ආරණ්‍යයකට සේනාසනයකට මොකක් හරි පරිත්‍යාගයක් කරන්න ඕනේ කියල එහෙම පරිත්‍යාගයක් කරා. කවුද දැන් ඒ පරිත්‍යාගය කරේ? ගුණවර්ධන. ඒ ක්‍රියාව කරපු නිසා දැන් එයාට ඒ ක්‍රියාවට අනුව වැටෙනවා නමක් මොකක්ද? දානපතිය. දැන් අපි හිතමු ගුණවර්ධන කියන නම නැතුව 'දාන පතියා විසින් මේ ගොඩනැගිල්ල සාදන ලදී' කිව්වොත් - කවුද හැදුවේ? දානපතියා. දැන් කවුද ඒ දානපතියා?

ගුණවර්ධන මහත්තය. හැබැයි ගුණවර්ධන මහත්මයාගේ නම එතැන නෑ. දැන් ඒ ක්‍රියාවට අනුවයි එතන නම තියෙන්නේ. දැන් අපි මෙහෙමත් හිතමු, රූපවාහිනීයක් හොරකම් කරගෙන යනවා ධනපාල කියල කෙනෙක්. දැන් අපි කියන්නේ කවුරු හොරකම් කරා කියලද? හොරෙක් අරන් ගියා කියලානේද කියන්නේ? දැන් ඒ හොරකම් කරපු එක්කෙනා මොන ධනපාල උනත් අපි කියන්නෙම 'හොරා' කියලනේ. ඒ කුමක් නිසාද? ක්‍රියාවට අනුවයි එහෙම කියන්නේ. අපි 'නම්' දාන්නේ ක්‍රියාවට අනුවයි නේද? ප්‍රතිසන්ධියත් ඒ වගේ. චුතියත් ඒවගේ. හිතකින් කරන ප්‍රබල, විශේෂිත ක්‍රියාවක් නිසා ඒ ඒ ක්‍රියාවට අනුව ඒ හිත හඳුන්වනවා.

<u>ප්‍රශ්නයක්</u> - භවාංග චලන කියන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - භවාංග චලන කියන්නෙත් ඒ භවාංගයේම තිබෙන්නාවූ වෙනස් වී යන ආකාරයක්. ඒ හිතමයි, නමුත් ඒකට 'දිගට යාගන්න බෑ' කියන්න වගේ අවස්ථාවක්. නැතුව වෙන හිතක් නෙමෙයි. භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද කියල කියන්නේ භවාංග සිතේ අවස්ථා තුනක්නේ.

<u>ප්‍රශ්නයකට දෙන පිළිතුරක්</u>

රහතන්වහන්සේලාට කර්ම, කර්ම නිමිති, ගති නිමිති පහළ වෙන්නේ නැත්තේ උන්වහසේලා විපාක හදන සිත් හදල නැති නිසාවෙන්. ඒවා පහළ වෙන්නේ කර්ම ශක්තිය තිබුනොත් විතරයි. දැන් අපිට එහෙම නෙමෙයිනේ, අපිට කරුණු දෙකක් වෙනවා. එකක් තමයි, ප්‍රතිසන්ධි සිතක් තියෙනවා, ඒකම භවාංග වෙලා තියෙනවා, ඒකෙන්ම චුති වෙනවා. චුතිය වෙන්න එනකොටම කර්මය, කර්ම නිමිති හෝ ගති නිමිති එන විදියටයි අපේ හිත තියෙන්නේ. චුති සිත පහළ උනාට පස්සේ අර එන එක්ක එල්ලිලා අලුත් එකක් හදා ගන්නවා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස දැන් අශෝක අධිරාජයා අසූහාරදහසක් වෙහෙර විහාර හදල අන්තිම මොහොතේ පවන් සලන අවාන වැදිලා ඇති වෙච්ච ද්වේශය නිසා පිඹුරෙක් උනා කියල කියනවා. ඒ 'චුති සිත' වෙනස් වීම නිසාද?

<u>පිළිතුර</u> - නෑ, දැන් සාමාන්‍යයෙන් බණ දේශනා කරලා තියෙනවනේ. ඒ බණ පොත්වල උනත් චුති සිත වෙනස් වීම නිසා එයා ඉපදුනා කියල කියනවනම් ඒක බණක් නෙමෙයි. අශෝක රජතුමා හරි වෙනත් කෙනෙක් හරි ඒ බලපු එහෙකින් 'චුති සිත' වෙනස් උනා, ඒක හින්ද එයා නරක තැනක හෝ හොඳ තැනක ඉපදුනා කියල කියනවානම් ඒක වැරදියි. කවරදාකවත් මහත්මයා 'චුති සිත' කියන එක චුතිය කරනවා ඇරෙන්න ඒක වෙනස් කරන්න බෑ.

අශෝක රජ්ජුරුවන්ට ඉපදීමට හේතුව උනේ පැණි මුලක්. අසෝක රජතුමා මේ මනුෂ්‍ය ලෝකේ ඉපදෙන්න හේතුවූ මූලය තමයි පැණි මුල. ඉහත ආත්මයකදී පසේබුදුරජාණන්වහන්සේ කෙනකුට පාත්‍රය පිරී ඉතිරී යනතෙක් කළ ඒ පැණි පූජා පිංකම සම්බන්ධයෙන් අරමුණක් තමයි මරණාසන්න චිත්ත වීථියට අරමුණු උනේ. ඒක, පසේ බුදුරජාණන්වහන්සේ වෙන්න පුළුවන් - පැණි මුල වෙන්න පුළුවන් - ඒ පැණි පාත්තරේ වෙන්න පුළුවන්. හැබැයි මූලය තමයි ඒ පැණි මුල.

මෙහෙම එකක් වෙනවා. අපි කරපු පිංකම් තියෙනවා load වෙලා, පරණ පරණ පරණ ඒවා ගොඩක් තියෙනවා. ප්‍රතිසන්ධි සිත් හදන්න පුළුවන් කර්ම - කර්මනිමිති මතුකරන්න පුළුවන් ශක්තිය තියෙන - ගති නිමිති මතුකරන්න පුළුවන් කර්ම ගොඩක් තියෙනවා. අපි හිතන්න හොඳ නෑ පොඩි කාලේ අම්මගේ ඔඩොක්කුවෙන් බැහැපු කාලේ ඉඳල - අපිට තේරෙන කාලේ ඉඳල කරපු ටිකෙන් කියල මේ කර්ම - කර්ම නිමිති - ගති නිමිති හැදෙන්නේ කියල. එහෙම හිතන්න හොඳ නෑ. සංසාරේ පරණ ඒවා කෙලින්ම එනවා. ඔය චුතිය වෙන්න යනකොට පරණ ඒවා මතුවෙලා එනවා. ලොකු ලොකු ශක්තිමත් ඒවා ඉස්සරහට ඉදිරිපත් කරලා තල්ලුකරල දානවා. තල්ලුකරලා දැම්මහම සමහරවෙලාවට අපි මෙහෙන් චුතවෙලා යන්නේ මෙහෙ කරපු එහෙකින් නෙමෙයි. පරණ එහෙකින් යන්නේ. පෙර භවයේ තිබ්බ්ච ශක්තියකින් අපිට ඉස්සරහට ඉදිරිපත්කරලා දෙනවා. දැන් මේ රජතුමා මනුස්සලෝකෙට එනකොට එයා හොඳ කුසල් සිතකින් එන්නේ. අපි කියන්නේ නෑ ඒක සෝමනස්ස සහගතද - ඤාන සම්ප්‍රයුක්තද - අසංඛාරිකද කියලා. හැබැයි එහෙම කුසල් හිතකින් තමයි ඇවිත්

තියෙන්නේ, පසේ බුදු කෙනෙකුට දීපු දානයක විපාකයක් හැටියටනේ ඒ හිත පහළ වෙන්නේ.

අපි හිතමු  අශෝක රජ්ජුරුවන්ට ආපු ප්‍රතින්ධි සිත කියල**'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික  සිතක්'** කියල **.**




දැන් ඉහත ඇති සටහනට අනුව 'පෙර භවයේ චුතිය' | 'වර්තමාන භවයේ ප්‍රතිසන්ධි' |භ.භ.භ.භ භ.භ.භ.භ |චුතිය |අලුත් භවයක ප්‍රතිසන්ධිය. දැන් ඒ අලුත් භවයක ප්‍රතිසන්ධිය ගැනීමට  පෙර තිබු  භවයේ ඇති වෙච්ච  අන්තිම හිතත් භවාංගයක්මයි. ඒ සිතයි  ඒ භවයේ මුලදීම ඇතිඋන ප්‍රතිසන්ධි සිතයි දෙකම සමානයි. ඉතින් ඒ අවසාන භවාංගය ඉවර උන ගමන්ම ප්‍රතිසන්ධියක් හැදෙනවා. හරිනම් ඒ චුති සිත නම් කරන්න ඕනේ අවසාන භවාංගය කියල තමයි. නමුත් ඒ සිත ඒ  භවයේ  අවසානම සිත  නිසා එය 'චුති සිත' නමින් හඳුන්වනවා.

උදාහරණයක් වශයෙන් ගත්තොත් මහත්තය දැන් මහත්තයලගේ දෝණියන්දෑ කෙනෙක් ඉන්නවා. ඉතින් ඒ දෝණියන්දෑ ඉපදිච්ච දවසේ ඉඳල ඔඩොක්කුවේ හුරතල් උනා, හැදුන වැඩුන, කෑව බිව්වා දැන් මෙයා විවාහ කරලා දෙනවා. විවාහ කරලා දෙනවා කියල කියන්නේ මොකක්ද? යනවා කියන එකනේ. ඒ යන වෙලාවට ඇත්ත වශයෙන්ම කියන්න ඕනේ 'ගෙදරින් යන එක්කෙනා' කියලනේ. දැන් දුව = ගෙදරින් යන එක්කෙනා . එහෙම නේද? හැබැයි ඒකද කියන්නේ? නෑනේ, මනමාලි කියලනේ කියන්නේ. ඔය නම දීල නේද යවන්නේ. ඉතින් ඒවගේ, මේ අවසාන භවාංගය තියෙනවානේ, අපි ඉතින් ඒ නම

කියන්නේ නැතුව ටිකක් ගෞරවාන්විතව 'චුති සිත' කියල කියනවා. ඇත්තටම අවසාන සිත භවාංගයක්. තේරුනාද? මේ සියල්ලම සිත් 89 යට අයිති සිත්.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස, සංසාරේ කරපුවයි මේ ආත්මේ කරපුවයි ඔක්කොම කර්ම තියෙන්නේ භවාංගයේද? ඒකෙන්ද ඒවා මතුවෙලා එන්නේ?

<u>පිළිතුර</u> - මෙහෙමයි තියෙන්නේ, භවාංගට සම්බන්ධයක් ඇත්තෙත් නෑ නැත්තෙත් නෑ. භවාංගයේ විශේෂ කර්ම තියෙනවා කියල කියන්නෙත් නෑ. දැන් මෙහෙම හිතන්නකෝ බලන්න. වතුර තියෙනවනේ, දැන් මහවැලිගඟේ වතුර තියෙනවනේ? දැන් මිනුස්සු ඕකේ නානවනේ. ඒකෙ විදුලිය තියෙනවද? නැනේ. හැබැයි ජලයෙන් විදුලිය නිෂ්පාදනය කරන්නත් පුළුවන්. ඒ වගේ භවංග සිත කියන එක කර්මයට සම්බන්ධ නෑ කියල කියන්න බෑ. හැබැයි එකේ තියනවා කියල කියන්නත් බෑ. වතුරේ current එක තියෙනවා කියන්නත් බැහැ. නෑ කියන්නත් බැහැ. නෑ කියන්න බැරි වතුරෙන් විදුලිය නිෂ්පාදනය කරන නිසා. ආන්න ඒ වගේ. ඒකහරි පුදුම දෙයක්.

<u>ප්‍රශ්නයකට දීපු පිළිතුරක්</u> - අසෝක රජ්ජුරුවෝ පිඹුරෙක් වෙලා ඉපදෙන්න හේතුව ඒ අන්තිම චිත්ත වීථිය යන්න කලියෙන් අම්ම කෙනෙක් ඇවිල්ල පවන් ගහනකොට එයාට තරහ ඇතිඋනා. හැබැයි ඒ චුති සිතනිසා නෙමෙයි. ඒ චුති සිත මේකමයි. හැබැයි එයා ප්‍රතිසන්ධිය අලුතෙන් හදා ගත්තේ ඒ අවසාන චුති සිතට පොඩ්ඩක් කලියෙන් එයාට අරමුණක් ඇවිල්ල තිබුන. ඒකෙන්.


ස්වාමීන්වහන්ස, මැඩියෙක් බණ අහල දිව්‍යලෝකේ ගියා කියල තියෙනවනේ.

ඔව් ඒකටත් සමානයි. තිරිසන්සතුන් උපදින්නේ **'අකුසල විපාක සන්තීරණ'** සිතින්නේ. එතකොට ඔක්කොම සන්තීරණ සිත්නේ භවාංග වෙන්නේ. එතකොට චුති සිතත් අකුසල විපාක සන්තීරණයක්මයි. හැබැයි ඒ චුතියට කලින් ඒ තිරිසන් සතාට සද්දයක් ඇහිලා ඒ සද්දයට අනුකූලව චිත්ත වීථි වැඩකරා. එතකොට එයාගේ චුතිය ලංවෙනකොට ලඟම තිබ්ච්ච අරමුණ හැටියට, කර්ම නිමිත්තක් හැටියට තිබුනේ අර ප්‍රසාදනීය සද්දේ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස දැන් පිං කරනකොට ඒවාට ඇලෙන්නේ නැතුව, අනිත්‍ය බලමින් විදර්ශනා කරත්, කොච්චර පිං කරත් හොඳ නැති දෙයක් හිතට එනවා කියමුකෝ. එතකොට අනිත්‍යයයි කියල බැලුවොත් එහෙම ඒක නැති කරන්න පුලුවන්නේද? උදාහරණයකට තරහක් අවොත් තරහ අනිත්‍යයයි කියලද හිතන්න ඕන?

<u>පිළිතුර</u> - එහෙම බලල පුරුදු වෙලා තියෙනවා නම් පුළුවන්. තරහක් ආවොත් තරහ අනිත්‍යයයි කියල හිතන්නත් ඕනේ. අරමුණ අනිත්‍ය යයි කියල හිතන්නත් ඕනේ. වැඩක් නෑ කියල හිතන්නත් ඕනේ. පුරුදු කරලා තිබුනොත් පුරුදු මනසිකාරය එනවා.

මෙහෙම තියනවා. විදර්ශනා කිරීම තුල කර්ම සිද්ධ වෙනවද? කර්ම හැදෙනවා. ඇයි කර්ම හැදෙන්නේ?




දැන් කෙනෙක් විදර්ශනා කරන කොට භවාංග සිත් වලින් මිදිලා චිත්ත වීථී පහළ වෙනවා. (ඉහළ රූප සටහන) අපි හිතමු ඒවා මනොද්වාරිකයි කියලා. ඒ චිත්ත වීථියේ ජවන සිත් තියෙනවා. දැන් ඒ චිත්ත වීථි වලින් ඒ කෙනා සංස්කාරයන්ගේ අනිත්‍ය දුක්ඛ අනාත්ම බලනවා. දැන් මේ චිත්ත වීථිය මොන එකක්ද? වර්ග හතරනේ තියෙන්නේ. කාමාවචර සිත් තියෙනවා - රූපාවචර තියෙනවා - අරූපාවචර තියෙනවා. ලෝකෝත්තර තියෙනවා. කුසල් පැත්තට ගියාන් පස්සේ 4 වර්ගයක් තියෙනවා. අකුසල් පැත්තට ගියහම එකක් තියෙනවා. අකුසල් වලින් විදර්ශනා කරන්න පුලුවන්ද? බැනේ. ඒකනිසා කුසල් සිත් අටෙන් එකකින් විතරනේ කරන්න පුළුවන්. දැන් තියෙනවනේ කුසල් සිත් 8 ක්

සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික | සසංඛාරික

සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික | සසංඛාරික


උපේක්ඛා සහගත  සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික | සසංඛාරික

උපේක්ඛා සහගත  සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික | සසංඛාරික

මේ සිත් අටෙනුත්, විදර්ශනා කරන්න නම් ඥාන සම්ප්‍රයුක්ත සිත් අවශ්‍යමනේ. සෝමනස්ස සහගත හරි, උපේක්ෂා සහගත හරි ඥාන සම්ප්‍රයුක්ත සිත් අවශ්‍යමයි. දැන් ඔන්න විපස්සනා කරා. දැන් නැවතත් සිත භවාංග ගතවෙලා නැවතත් විදර්ශනා සිතක් පහළ වෙනවා. මේ අනුව සිත භවාංග ගත වෙමින් නැවත විදර්ශනා සිත් පහළ වෙනවා. මේ විදර්ශනා සිත් ඔක්කොම කුසල් සිත්. මේ සිත්වල ජවන් සිත් තියෙනවා. දැන් මේ චිත්ත වීථි වලින් විදර්ශනා කරනකොට කුසල් සිද්ද වෙනවද? සිද්ද වෙනවා. කුසල් වැඩෙනවා. පිං සිද්ධ වෙනවා. හේතුව කර්ම රැස්කිරීම තියෙනවා. සෝමනස්ස සහගත හෝ උපේක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත් ඒවා. විදර්ශනා කරන කොට බොහෝ සිත් අසංඛාරිකයි - ඒවා ප්‍රබලයි. ඒ සිත් වල කර්ම රැස් කිරීම තියෙනවා. අනිත් එක කවුරුහරි කියනවනම් විදර්ශනා කිරීමේදී පිං සිද්ද වෙන්නේ නැහැ, කුසල් සිද්ද වෙන්නේ නැහැ කියල, ඒක ධර්ම විරෝධියි.  හේතුව, එහෙම නම් ඒ හිත් අකුසල් සිත් වෙන්න ඕනේ නැත්නම් රූපාවචර වෙන්න ඕනේ නැත්නම් අරූපාවචර වචර වෙන්න ඕනේ. රූපා වචර හෝ අරූපාවචර සිත් වලින් විදර්ශනා කරන්නත් බෑ. එහෙම නැත්නම් ලෝකෝත්තර සිත් වෙන්න ඕනේ. ලෝකෝත්තර සිත් වලින් විදර්ශනා කරන්නත් බෑ. එහෙමනම් රහතන්වහන්සේලාගේ ක්‍රියා සිත් වෙන්න ඕනේ. මේවා ක්‍රියා සිත් නෙමෙයි. මේවායේ අනිවාර්යෙන්ම කුසල් සිදු වෙනවා. වෙනස තියෙන්නේ විදර්ශනා සිත්වල තිබෙන කුසල ශක්තිය අනිත් ආමිස කුසලයකට වඩා බලගතුයි. හේතුව, සෝමනස්ස හෝ උපේක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත භාවය සහ අසංඛාරික භාවය ප්‍රබල විදියට විදර්ශනා සිත් තුල තිබෙනවා. ඒකනිසා මේ විදර්ශනා සිත්වල තිබෙන ශක්තිය - බලය හරි වැඩියි. මේ වගේ විදර්ශනා භාවනාවක් කරලා එවැනි  සිතකින් කිසියම් කෙනෙක් ප්‍රතිසන්ධිය ගන්නවනම් ඒ සිත ඉතාම බලවත්  ඥාන සම්ප්‍රයුක්ත හිතක්. අසංඛාරික හිතක්. ඒ එක්කෙනාට පොඩි කාලේ ඉඳලම ලෝකයේ අනිත් කට්ටියට නොතේරෙන් දේ තේරෙනවා - වැටහෙනවා. හේතුව, ඒ හිත්වල තිබෙන බලය නිසා. අනිත් එක එයාගේ භවාංගත් විදර්ශනා සිතකින් පහළ කරපු භවාංගයක්. ආන්න ඒකයි තියෙන වෙනස.

මේ කාරණය බොහොම හොඳට පරෙස්සමෙන් තේරුම් ගත යුතුයි. තවත් කෙනෙකුට ප්‍රශ්නයක් ඇති උනායින් පස්සේ තමන්ගේ දැනුමෙන් වරද්දන්නෙ නැතුව කියල දෙන්න පුළුවන් විදියට තේරුම් ගන්නවනම් හරි වටිනවා. එතකොට තමයි ධර්මය හිතට ඇතුළු වෙන්නේ.

දැන් මේ කථා කරන්නේ චුති සිත ගැන. මරණාසන්න චිත්ත වීථියක තමයි චුතිසිත සිද්ද වෙන්නේ. හැබැයි ඒකට චුති චිත්ත වීථිය කියල කියන්නේ නෑ. ඒකට මරණාසන්න චිත්ත වීථිය කියල තමයි කියන්නේ. මරණාසන්න චිත්ත විථියක සිද්ධ වෙන, මේ ජීවිතියේ පහළ වෙන අවසානම හිත තමයි චුති සිත. ඉතින් ඒකටම දාල තමයි ප්‍රතිසන්ධියත් කථා කරන්නේ. මම මේක ඉස්සෙල්ලත් කියල තියෙනවා. පටලැවෙන්නේ නැතිවෙන්න තේරුම් ගන්න.




භවාංග සිත්

oooooooooooooooo


මේ භවාංග සිත් වලට අරමුණක් තියෙනවාද? ඔව්, මේ භවාංග සිත් වලට අරමුණක් තියෙනවා. ඒ අරමුණ තමයි මීට ඉස්සෙල්ලා ජීවිතයේදී මැරෙන්න කිට්ටු වෙන අවස්ථාවේදී පහළ උන කර්මය, කර්ම නිමිත්ත හෝ ගති නිමිත්ත යන තුනෙන් එකක් තමයි මේ භවාංග සිතට තිබෙන අරමුණ. භවාංග සිත අරමුණක් නැතුව තිබෙන එකක් නෙමෙයි. ඒකට අරමුණක් තිබෙනවා. ඒක

තමයි ප්‍රතිසන්ධි අවස්ථාවේ ගත්තු අරමුණ. අපේ සිත තුල ඇතිවෙන්නේ භවාංග සිත් විතරක් නෙමෙයිනේ. මේ භවාංග සිත් බිඳිලා චිත්තක්ෂණ 17 චිත්ත වීථි පහළ වෙනවා. එතකොට පටන් ගන්නේ භවාංග සිතකින්නේ. දැන් ඒ චිත්ත වීථිය අවසානයේදී සිත නැවතත් භවාංග ගත වෙනවා. අපි හිතමු ඒ ඉස්සෙල්ල ගිය චිත්ත වීථිය චක්ඛු විඤ්ඤාණ චිත්ත වීථියක් කියල. එතකොට ඒකටත් වෙනම අරමුණක් තියෙනවනේ, නේද? ඒ කියන්නේ භවාංගයට ඇති අරමුණයි භාවංගය බිඳිමෙන් පහළ වෙන චක්ඛු විඤ්ඤාණ චිත්ත වීථියටයි අරමුණු වෙන්නේ අරමුණු දෙකක්. ඒ චක්ඛු විඤ්ඤාණය පහළ වීමට ලැබුණ අරමුණ වර්තමාන ජීවිතියේ, ඒ මොහෙතේ පහළ වෙච්ච එකක්. මේ අවස්ථාවේදී භවාංග සිත් පහළ වීම නවතිනවා. (අපි හුස්ම ගන්නකොට ගලනාලය වැහෙනවා වගේ) ඒ චක්ඛු විඤ්ඤාණය චිත්ත වීථිය අවසන් උනගමන්ම නැවතත් ප්‍රතිසන්ධියේදී ගත්තු අරමුණම අරගෙන භවාංග සිත් පහළ වෙනවා. නැවතත් වෙනත් අරමුණක් අරගෙන (සද්දයක් හෝ සන්ධයක් හෝ වෙන ඕනෑම අරමුණක් විය හැකියි) භවාංගය බිඳී චිත්ත වීථියක් පහළ වෙනවා. එය අවසානයේදී නැවතත් සිත භවාංග ගත වෙනවා. අපි ඔය චිතතක්ෂණ 17 චක්ඛු ද්වාරික චිත්ත වීථි ආදී දේ ගැන කතා කරන්නේ පිටින් අරමුණු අරගෙන පහළ වෙන චිත්ත වීථි වලට. ඒවා අමු අමුවේ තිබෙන ඒ අවස්ථාවේම පහළ වෙන අරමුණු. භවාංගයගේ අරමුණ තේරුම් ගන්න අපහසුයි. එය එකම විදියයි.

දැන් අපි හිතමු කෙනෙක් මරණාසන්න අවස්ථාවට පත් වෙනවා කියල. මේ අවස්ථාවේදී එයාට පරණ කරපු කර්මයක් උලුප්පවලා දෙනවා. එතකොට එයාට මනෝද්වාරික හරි චක්ඛු ද්වාරික හරි අරමුණක් පහළ උනා කියල හිතමු. දැන් ඒ චිත්ත වීථිය එවෙලේම ඇති උන කර්ම නිමිත්තක් අල්ලගෙන යන චිත්ත විථියක්. = (A) පහතින් ඇති රූප සටහනේ ඇති පරිදි.




දැන් මෙහි භවංයේ ඇති අරමුණ වෙනස්. මරණාසන්න චිත්ත වීථියේ ඇති අරමුණ වෙනස්. (පහතින් ඇති රූප සටහන බලන්න)




දැන් මේ චිත්ත වීථිය අවසානයේදී නැවතත් සිත භවාංග අරමුණම ගෙන භවාංග ගත වෙනවා. නැවතත් පෙර ගත්තු කර්ම නිමිත්තම අරගෙන චිත්ත වීථියක් පහළ වෙනවා. මේ අනුව බොහෝ චිත්ත වීථි පහළ වෙනවා. අපි හිතමු මේ කෙනා මැරෙන්නේ හැන්දෑවට කියල. දැන් උදේ ඉඳන් මෙහෙම කර්ම නිමිත්ත අරගෙන

චිත්ත වීථි බොහෝ ගණනක් පහළ වෙලා අන්තිමට මරණාසන්න චිත්ත විථිය පහළ වෙනවා කියල හිතමු. මේ මරණාසන්න චිත්ත වීථියත් පෙර චිත්ත වීථි වලට අරමුණු වූ ඒ කර්ම නිමිත්තම ගෙන පහළ වෙනවා. මෙසේ වෙන්නේ එය බොහෝ වෙලාවක් මතු වෙමින් තිබුණ අරමුණක් බැවිනුත් එය ඉතා ළඟින්ම තිබෙන පහසුවෙන් ගත හැකි අරමුණක් බැවිනි. භවාංග - භවාංග උපච්ඡේද - භවාංග චලන - "මනෝද්වාරා වජ්ජන - ජවන - ජවන - ජවන - ජවන - ජවන - භවාංග | චුති යනුවෙන් අවසාන චිත්ත වීථිය පහළ වෙනවා. දැන් මේ අවසාන චිත්ත වීථිය නිරුද්ධ වෙන්න යනකොටම ළඟම තිබෙන එම කර්ම නිමිත්තම අල්ලාගෙන ප්‍රතිසන්ධි හිත පහළ වෙනවා. හැබැයි තේරුම් ගන්න ඕනෑ භවාංග සිත්වලටත් වෙනම අරමුණක් තිබුන කියල.


දැන් අලුත් භවයේ ප්‍රතිසන්ධි සිතට පසු භවාංග සිත් පහළ වෙනවා. නමුත් ඒ භවාංග සිත්වල දැන් අරමුණ පෙර භවයේ කර්ම නිමිත්ත ලෙස පහලවූ, අලුත් භවයේ ප්‍රතිසන්ධි සිතේ අරමුණමයි. දැන් තේරුනාද? ( රූප සටහන පහතින්)




<u>අදහසක්</u> - ස්වාමීන්වහන්ස දැන් තරහ හිතක් පහළ උනොත් මරණාසන්න මොහොතේදී ඔය වගේ හිත තැන්පත්වට තියෙන්නේ නැනේ.

<u>ස්වාමීන්වහසේ</u> - හිත තැන්පත්නම් හිත එක පේළියකට ගමන් කරනවා. හිත තැන්පත් වෙලා නැතිනිසා තමයි එක පේළියකට නැතුව අර උඩට උඩට ගිහිල්ල තියෙන්නේ. (රූප සටහනේ ඇති ආකාරයට)

මෙහෙම එකක් තියෙනවා. අපේ හිතේ තියෙනවා ආසේවන ප්‍රත්‍යය ස්වභාවය කියල හිතට පුරුදු ආකාරයක්. අපි කියන්නේ පුරුදු පුහුණු කරනවා කියල අන්න ඒ ගතිය. අපි යම්කිසි දෙයක් - තරහ හරි, ලෝභය හරි, මාන්නය හරි, ඊර්ෂ්‍යාව හරි මොකක් හෝ දෙයක් වැඩිපුර හිතල හිතල හිතට පුරුදු කරානම් ඒ අනුව, එයට ගැලපෙන ස්වභාවයේ හිතක් තමයි අවසානයේදී උඩට ඉලිප්පිලා එන්නේ. ඒඅනුව ළඟදීම ආපු අරමුණක් තිබෙනවා නම් ඒක ඉසමතුවෙලා එනවා. එතන ගිහිල්ල මුකුත් කරන්න බෑ. හැබැයි, සමහර වෙලාවට මෙන්න මෙහෙම දෙයක් කරුණාවන්ත එක්කෙනෙකුට කරන්න පුළුවන්.




A – B = භයානක අරමුණ    C – D = අලුතෙන් පහළ වූ කුසල් අරමුණ

මේ මරණාසන්න අරමුණු සමහර වෙලාවට බය සහගතයි. එතකොට ඒ කෙනා සමහර වෙලාවට කෑ ගහනවා. ඒවාට ප්‍රතිචාර දක්වනවා. එතකොට දිගටම පහළ වෙන්නේ බය සහගත අරමුණමයි. එතකොට 'එනවා එනවා' 'දුවනවා දුවනවා' කියල කෑගහනවා. ඥානවන්ත කෙනෙක් ඉන්නවනම් එයා දන්නවා මෙයා

ප්‍රතිචාර දක්වන්නේ අපිට නෙමෙයි මෙයාගේ මනසේ තිබෙන්නාවූ රූපකයකටයි ප්‍රතිචාර දක්වෙන්නේ කියල තේරුම් ගන්නවා. මෙයා ධර්මය පුරුදු පුහුණු කරලා නැති එක්කෙනෙක් නිසා එයාටප් අරමුණ වෙනස් කර ගන්න එයාට බෑ. අපි හිතමු එයාට පේන්නේ යකෙක් කියලා. දැන් එයාට ඒ මනසින් අරමුණු කරන දේ පෙනෙන අතරේ එයා වට පිටාවේ තියෙන දෙයකුත් බලනවා, නැවත මනසේ පහළ වෙන අරමුණට බය වෙනවා, කෑගහනවා. ඔහොමනේ ඕක තියෙන්නේ. දැන් ඕක දැකපු ඥානවන්ත කෙනෙක් මේක තේරුම් ගන්නවා. මෙයාගේ සිත තුල භයානක සිද්ධියක් සිදුවෙනවා කියල දැනගෙන, එයා ලස්සන බුදුපිළිමයක් හරි ශ්‍රමණ රූපයක් හරි පිරිත් සජ්ඣායනාවක් හරි මල් වට්ටියක් හරි ලොකු අරමුණක් මෙයාට අහන්න හරි පේන්න හරි සලස්වනවා. ඊට පස්සේ එතැන ඉඳන් එයාට පෙන්නේ අලුත් අරමුණ. දැන් මෙයා මෙහෙම ගිහිල්ල චුත වෙනවා. දැන් මෙයා චුත වෙනකොට චුත වෙන්නේ අර අලුතින් ලැබුණ ආරම්මණය අල්ලගෙන. ඇයි එහෙම වෙන්නේ? ඒක තමයි චුති සිතට ළඟම තිබුන අරමුණ, ඒකයි.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස පෙර කරපු දේවලුත් එනවද කර්ම, කර්ම නිමිති වශයෙන්?

<u>ස්වාමීන්වහන්සේ</u> - එනවා, එනවා, එක එක ජාති තියෙනවනේ reel එකේ. ගිනිදැල් වගේ ඒවා එනවා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස එක බණක තිබුනා අපි කොච්චර පිං කරත් අපි ඒවා අනිත්‍ය වශයෙන් බලන්නේ නැත්නම් පෙරේතයෝ වෙනවා කියලා.

<u>පිළිතුර</u> - ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ සාසනයක් තියෙන කාලෙක විතරයි විදර්ශනා කිරීම ලෝකයට මතු වෙන්නේ. අනිත්‍ය දුක්ඛ අනාත්ම කියන දර්ශනය මතුවෙන්නේ, විදර්ශනාව මතු වෙන්නේ බුදු කෙනෙක් ලෝකයට පහළ උන කාලයක විතරයි. එතකොට ලොව්තුරා බුදුරජාණන්වහන්සේලා නැතිකාල වල විදර්ශනා නෑ. ඒ කාලවලත් මිනුස්සු දන් දෙනවා, සිල් රකිනවා, භාවනා


කරනවා. එතකොට ඔය කථනයට අනුව ඒ පින්කරපු ඔක්කෝම අපායේ යන්න ඕනේ. එහෙම නේද? ඒ කාලේ විදර්ශනා නැනේ.

සමහර දේශනා තියෙනවා ඒවා බණ කියල කිව්වට බණ නෙමෙයි. හොඳට තේරුම් ගන්ට, **'චෙතොපසාදහෙතු හි, සත්තා ගච්ඡන්ති සුග්ගති'** අහල තියෙනවද මේ බණ? **'චිත්ත ප්‍රසාද හේතුවේ මාත්‍රයෙන් සත්වයෝ සුතියට යති''.** මැඩියා දිව්‍යලෝකේ ගියේ විදර්ශනා කරලද? ඒ ගොල්ලන්ට විදර්ශනා හිතක් තිබුනද?

ස්වාමීන්වහන්ස එතකොට ළමයි ගැන ආස උනොත්?

<u>ස්වාමීන්වහන්සේ</u> - එතකොට ඒක පිනක් නෙමෙයිනේ. ඒක කෙලින්ම ආසාවනේ. මෙහෙමයි, 'පිනයි' කියන එකයි 'පවයි' කියන එකයි 'ආරම්මණය' කියන එකයි 'ඇලීම' කියන එකයි, ඕවා වෙනස්. දරුවන්ට ඇලීම් තියෙනවා නම් ඒකාන්තයෙන්ම නරක තැනට තල්ලු කරනවා. මෙහෙම තියෙනවා. හොඳට පරෙස්සමෙන් අහන්න. බුදුරජාණන්වහන්සේ දේශනා කරපු ධර්මයේ පැටලිලි නෑ. හරි පැහැදිලියි. හරි පිරිසිඳුයි. එක තැනක තියෙනවා, බුදුරජාණන්වහන්සේ වැඩ ඉන්න කාලේ මුගලන් මහා රහතන්වහන්සේ එක වයසක අහිංසක කාන්තාවක් ලවා බුදුරජාණන්වහන්සේට වැන්දෙව්වා කියල. හැබැයි එයා ලවා වැන්දෙව්වා විතරයි විදර්ශනා කලේ හෝ ඒ මොකක්වත් කලේ නෑ. ඒකතමයි හේතුඵල ධර්මයේ තිබෙන ස්වභාවයේ. ඒ මහලු කාන්තාව සුගති ගාමී උනා.


මෙන්න මෙහම එකක් තියෙනවා. කෙනකු භාවනා කරන විට භාවනා අරමුණක් එනවා. අපි හිතමු ඒ භවනා අරමුණ ධ්‍යාන ආරම්මණයක් කියල. ඒක ගරු ආරම්මණයක්. නැවතත් හිත භවාංගයට වැටෙනවා. ආයිමත් මොකද වෙන්නේ අර ධ්‍යාන ආරම්මණය ගන්නවා. ඊළඟට ආයිමත් භවාංගයට වැටෙනවා.




දැන්මෙයා මරණාසන්න අවස්ථාව දක්වාම මේවගේ හොඳට භාවනා කරනවා. මෙයා මේ විදියට හොඳට භාවනා කරපු නිසා චිත්ත වීථි කෝටි ගණන් දැන් ගිහිල්ල තියෙන්නේ. ඒ කෝටි ගණන් ගිහිපු චිත්ත විථිවලට ඒ අරමුණ හොඳට අහුවෙලා තියෙන්නේ. ඒ අරමුණ හිතෙන්ම ඇතිවෙච්ච හොඳ අරමුණක් - ධ්‍යාන අරමුණක්නේ, ඒකනිසා. ඒකට කියනවා ගරු ආරම්මණය කියල. දැන් මෙයා චුත වෙන්න යනවා. චුත වෙන්න යනකොට මෙයාට වෙන අරමුණු එන්නේ නෑ. හේතුව, මේ අරමුණ තරයේම record වෙලා තියෙන්නෙ. දැන් එන්නෙත් ඒ ගරු ආරම්මණයමයි. ඊට පස්සේ එයා චුත වෙනවා. ඊළඟ මොහොතේ ප්‍රතිසන්ධිය ගන්නවා. ඒ ප්‍රතිසන්ධි සිතේ අරමුණත් ඒ ගරු ආරම්මණයමයි. මේක ගරුක කර්මය 'කුසල පැත්තෙන්'.

හොඳයි සැම දෙනාටම තෙරුවන් සරණයි !

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.